## හඳුනාගන්න...

හැම දරුවෙක්ම එක වගේ නැහැ. ඉගෙනීමේදී එක හා සමානව දක්ෂකම් දක්වන්නේ නැහැ. ඒත් ඉගෙනීමට බොහෝ දක්ෂකම් නොදක්වන දරුවන් තුළ වෙනත් ක්ෂේත්‍රයන් පිළිබඳ අසීමිත හැකියාවන් තිබිය හැකියි. ඔබ නොදන්නා සැඟවුණු දක්ෂතාවන් පැවතිය හැකියි. ඔබේ වගකීම විය යුත්තේ මෙම හැකියාවන් හඳුනාගනිමින් ඒවා ඔප්නංවා ගැනීමට ඔවුන්ට මගපෙන්වීමයි. එසේ නොමැතිව දරුවා ඉගෙනීමට දක්ෂ අනෙක් දරුවන් සමඟ සංසන්දනය කරමින් ඔහුට දෝෂාරෝපණය කිරීම තුළින් ඔහු හෝ ඇය තුළ පවත්නා අනෙකුත් දක්ෂතාවන්ද ගිලිහී යා හැකියි.

## ඔබේ දයාවෙන් දරුවන්ට සිනහවක්...

දරුවන් කිසිදු ආකාරයක කායික හෝ මානසික හිංසනයට ලක් කිරීමට කිසිවෙකුට හෝ කිසිදු අයිතියක් නැහැ. එවැනි ක්‍රියා ඇතැම් විට රටේ පවත්නා නීතිය අනුව බරපතළ වරදක් පවා විය හැකි බව ඔබ මතක තබා ගත යුතුයි. සැර පරුෂ වදන්වලින් හෝ වේවැල් පහර කිහිපයකින් දරුවන්ගේ ජීවිත තුළ ඇති කළ නොහැකි වෙනසක් සිදු කරන්නට අම්ම තාත්තගේ හෝ ගුරුවරයකුගේ එක් ආදර වදනකින් පමණක්ම පුළුවන්...

උපතේ පටන් අවුරුදු 18 ක් පුරා දිවෙන ළමා ලෝකය බොහෝ සුන්දර වූවක්. වැට කොටු මැද දරුවන් සිර නොකොට එකී අසීමිත සුන්දරත්වය විඳීමට ඔවුන්ට ඉඩ කඩ විවර කොට දීම සමස්ත සමාජයේම වගකීමක්. මව්බිමේ අනාගතය වෙනුවෙන් එය වඩාත් අර්ථවත් කැපවීමක් වේවි.

**1929**

**ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය**

පැය 24 පුරා නොමිලේ ක්‍රියාත්මක සේවාවකි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
අංක 330, තලවතුගොඩ පාර,
මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.
දුරකථන - 011 2778911 - 12 - 14
ෆැක්ස් - 011 2778915
විද්‍යුත් තැපෑල - ncpa@childprotection.gov.lk
වෙබ් අඩවිය - www.childprotection.gov.lk

# දයාවෙන් සිනහවක්...

## ළමා හිංසනය පිටු දකිමු



ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## අපේ උරුමය.....

අපි හැමෝම ජීවත්වෙන්නේ ලෝක සිතියමේ පුංචිම පුංචි තිතක් තරම් වූ දිවයිනක.. ඊත් වසර දහස් ගණනක අභිමානවත් ඉතිහාසයක් තුළ ගොඩනැගුණු මහා සංස්කෘතියක් විසින් ඒ පුංචි තිත ලෝකයේ ඉහළින්ම ඔසවා තබන්නට සමත් වූ බව අපි දන්නවා. ලෝකයේ අන්‍ය කිසිදු ජාතියකට නොදෙවෙනි අභිමානවත් සංස්කෘතියක් තුළින් ගොඩනැගුණු අනන්‍යතාවක් අප සතුයි. දරුවන් වඩාත් ආදරයෙන් රැකබලා ගැනීමත් ඒ අභිමානවත් සංස්කෘතිය තුළින් අප ලැබූ මාහැඟි දායාදයක්.

## අපි අද ඉන්නෙ කොතනද....

සියවස් ගණනාවක් තිස්සේ අප අත්දකිමින් පවතින විවිධාකාරයේ සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික වෙනස්කම් හේතුවෙන් අප සතු හර පද්ධතීන් එක්තරා දුරකට බිඳවැටෙමින් පවතිනවා. විවිධාකර වූ ළමා අපයෝජනයන් ලෙස ශ්‍රී ලංකා සමාජය අත්විඳින්නේ මේ සමාජ වෙනසෙහි අහිතකර ප්‍රතිවිපාකයන්. සමාජ වෙනස හොඳ හෝ නරක වේවා, එහි වඩාත් අහිතකර ප්‍රතිඵල භුක්තිවිඳින්නන් බවට අපේ රටේ අනාගතය වූ දරුවන් පත්වීම නම් සැබවින්ම ඛේදවාචකයක්. ළමා හිංසනය ළමා අපයෝජනයේම තවත් එක් අඳුරු පැතිකඩක්. අපේ සමාජයේ දරුවනුත් විවිධාකරයේ කායික සහ මානසික හිංසනයන්ට ලක් වෙමින් පවතින බව අප අමතක නොකළ යුතුයි.

## අපේ වගකීම....

නිදහස් සිතුම් පැතුම් සහිත නිර්මාණශීලී සහ පූර්ණ පෞරුෂයකින් යුක්ත දරුවකු සමාජයට දායාද කිරීමට නම් ඒ සඳහා සුදුසු සමාජ වටපිටාවක් නිර්මාණය වී තිබීම අත්‍යවශ්‍ය කරුණක් බව අමුතුවෙන් කිවයුතු නැහැ. මෙහිදී විශේෂයෙන්ම පවුල් ඒකකය සහ පාසල වෙත පැවරෙන වගකීම සුවිශේෂයි. නිසි පෝෂණය, නිසි සෞඛ්‍ය පහසුකම් ලබාදීම, නිසි අධ්‍යාපනයක් ලබා දීම, වගේම බොහෝ දෙනා ඇතැම්විට අමතක කරන ආදරය, සෙනෙහස සහ රැකවරණය දරුවන්ට ලබාදීමත් බෙහෙවින්ම වැදගත්.

දරුවන්ගේ සංවර්ධනය සම්බන්ධව දෙමාපියන් සහ ගුරුවරුන් වෙතින් ඉටු විය යුතු වගකීම් රාශියක් තිබෙනවා. දරුවන්ගේ සිතුම් පැතුම් තේරුම් ගැනීම, දරුවන්ට සවන්දීම, කොන්දේසි විරහිතව දරුවන්ට ආදරය කිරීම ඒ අතරින් ප්‍රධානයි.

මවගේ සෙනෙහසිනුත් පියාගේ උණුසුම් සුසුම්නුත් ලබා දෙන ආත්ම විශ්වාසයත්, රැකවරණය පිළිබඳ හැඟීමත් දරුවනට ගෙන එන්නේ මනා ආත්ම ශක්තියක්.. පහරදීම් වෙනුවට, කරුණා දයාව පිරිපුන් ඇකයෙහි උණුහුම දරුවෙකුට මනා ආත්ම විශ්වාසයක් ගෙන දෙනවා සේම ඉන් අනාගතයට මුහුණ දිය හැකි ශක්තියක්ද ගොඩ නගනවා. එහෙත් අද වනවිට ඔවුන්ගේ ජීවිතවලට නියමාකාර මාර්ගෝපදේශයක්, දැක්මක් දෙන්නට දෙමව්පියන්ගෙන් බොහෝ දෙනකු අසමත් වෙලා. කාලකණ්නියා, බූරුවා, වගේ අනිසි වචන පවා ඔවුන්ගේ ශබ්දකෝෂයට එකතු වෙලා. ක්‍රියාවෙනුත් වදනිනුත් උපරිම දයාවක්, සෙනෙහසක් දැනුණු දෙමාපිය ඇසුර දරුවෙකුට මහාර්ඝ සම්පතක් බව සිතට ගන්න. ඔවුන් වෙනුවෙන් සැදූ ලොව ඔවුන්ම වෙනුවෙන් ඔවුනගේ සැපත යහපත සතුට වෙනුවෙන්ම ගොඩ නගන්න අද අදම ක්‍රියා කරන්න.

## හිතන්න....

ඔබේ වගකීම විය යුත්තේ ගුණවත් යහපත්කම් හා පූර්ණ පෞරුෂත්වයකින් යුක්ත දරුවකු සමාජයට දායාද කිරීමයි. දරුවන්ගේ ජීවිත තුළ හික්මීම, විනය, අභියෝග භාරගැනීම, නායකත්වය, නිර්මාණශීලීත්වය, අන්‍යන්ට ගරු කිරීම, ජය පරාජයන් සමසේ භාරගැනීම, සංවේදී බව, නිදහස් චින්තනය ආදී ගුණාංග වර්ධනය කිරීමයි. දරුවා තුළ පූර්ණ පෞරුෂයක් ගොඩනැගෙන්නේ මේ සියල්ලේ එකතුවෙන්. අධ්‍යාපනය සහ විභාග සමත්වීම යනු ජීවිතයේ එක් පැතිකඩක් පමණයි.

දරුවන්ට ඉන් එහා ගිය ලෝකයක් වෙනුවෙන් මගපෙන්විය යුතුයි. දරුවන් හදා වඩා ගැනීමේදී හිංසනය යන්න කිසිදු විටෙක භාවිත නොකළ යුතුයි. ආවේගශීලී බැණ වැදීම්, නොසළකා හැරීම් ආදිය තුළින් ඔබ දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදු කරන්නේ ළමා අපයෝජනයක්.එසේම එවන් ක්‍රමවේද මගින් දරුවන් යහමගට ගැනීමේ කිසිදු හැකියාවක් නැහැ.